1st Place Winner
National Productivity
Award 2020

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

ISO/IEC 17021
QMS-001-01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/2/11/12/4 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2023.07. 10 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන, මුදල්, ඉංජිනේරු සේවා, සැලසුම්),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය - Phase V - වැඩසටහන් සහකාර තනතුර සඳහා බඳවා ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/16/5/10-11-HR, PL/16/1/17-Cadre හා 2022.03.28, 2023.03.13, 2023.03.31 දිනැති ලිපි හා බැඳේ.

02. එමගින්, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ V වන අදියර සඳහා වැඩසටහන් සහකාර තනතුරු 09 ක් අනුමත වී ඇති බවත්, එකී තනතුරු සඳහා එක් පළාතකට එක් නිලධාරියෙකු වන සේ දැනට සංවර්ධන නිලධාරි සේවයෙහි සේවයේ නියුතු නිලධාරීන් 09 දෙනෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව බඳවා ගැනීමට අදහස් කර ඇති බවත්, ඒ සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරන නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර නිලධාරියෙකු තෝරා ගෙන පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා එකී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙසත් මා වෙත දන්වා ඇත.

03. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවතින ආයතනවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අතරින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි දක්වා ඇති සුදුසුකම් (ඇමුණුම 01) සපුරා ඇති නිලධාරීන් සිටීනම්, එකී නිලධාරීන්ගේ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කර ඇති ආකෘතිය (ඇමුණුම 01) ප්‍රකාරව සම්පූර්ණ කර දත්ත පැතුරුම්පත් (MS Excel) භාවිතයෙන් සකස් කර **2023.07.20** දිනට පෙර spvacancies.cs@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ මා වෙත යොමු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමි.

04. එමෙන්ම, එහි දෘඪ පිටපත කඩිනමින් මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

**සුමිත් අලහකෝන්,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය- කරු. දැ.ග.ස.
02. ව්‍යාපෘති ඉංජිනේරු, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, දකුණු පළාත. - කරු. දැ.ග.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

ඇමුණුම 01

<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි දක්වා ඇති සුදුසුකම් :-</u>

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව ප්‍රථම උපාධියක් ලබා තිබීම

හෝ

02. ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියට සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

03. පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

***මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන වැටුප් කේතය PS 06 (A කාණ්ඩය) වන අතර, වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධිවිධානවලට අනුව සිදු කෙරේ.

<u>ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය - Phase V - වැඩසටහන් සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ ආකෘතිය</u>

| අනු අංකය | ආයතනය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර | උපාධිය/උපාධියට සමාන සුදුසුකම | ව්‍යාපෘති කළමනාකරණයට අදාළව ලබා ඇති ආශ්‍රිත සාමාජිකත්වය හෝ වෘත්තීය සුදුසුකම | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | සුදුසුකම | සුදුසුකම ලබා ගත් ආයතනය |
| | | | | | | | |